# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


---

මගේ අංකය / எனது இலக்கம் / My NO – 193 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 18/02/2024

පැය 1130

## මාධ්‍ය නිවේදනය

<u>**පොලිස් විශේෂ කාර්ය බලකාය සම්බන්ධ තොරතුරු**</u>

**01. භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මගින් නිකුත් කරන වැලි ප්‍රවාහන බලපත්‍ර කූඨ ලෙස මුද්‍රණය කල සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුර.**

2024.02.17 වන දින උදෑසන කාලයේ පොළොන්නරුව පොලිස් වසමේ කදුරුවෙල නගරයේදී පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මගින් නිකුත් කරන වැලි ප්‍රවාහන බලපත්‍ර කූඨ ලෙස මුද්‍රණය කල සැකකරුවෙකු කූඨ ලෙස සකස් කරන ලද වැලි ප්‍රවාහන බලපත්‍ර 06ක්, පරිඝණක උපාංග හා මුද්‍රණ යන්ත්‍රයක් සමග අත්අඩංගුවට ගෙන පොළොන්නරුව පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක්වූ ජයන්තිපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පොළොන්නරුව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. මත්කරල් හා අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුර.**

2024.02.17 වන දින සවස් කාලයේ මන්නාරම පොලිස් වසමේ ඔලුතුඩාව ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර මත්කරල් 100ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 01 මිලිග්‍රෑම් 550ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මන්නාරම පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක්වූ මන්නාරම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මන්නාරම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.02.17 වන දින රාත්‍රී කාලයේ රාගම පොලිස් වසමේ හොරපේ ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 100 ක්, යතුරුපැදියක්, ජංගම දුරකථන 01ක්, හා මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන මුදල් රුපියල් 8650/=ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රාගම පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක්වූ වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** රාගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. භාවිතයට නුසුදුසු කසල තේ සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගම්පොල කඳවුර.**

2024.02.17 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගම්පොල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වෙලම්බොඩ පොලිස් වසමේ හඳුරම ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර භාවිතයට නුසුදුසු කසල තේ කිලෝ 4717 සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වෙලම්බොඩ පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වූ හඳුරව, වෙලම්බොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

**වෙලම්බොඩ** පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. බලපත්‍ර නොමැතිව ටිපර් රථයකට වැලි පටවමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර.**

2024.02.17 වන දින උදැසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පන්නල පොලිස් වසමේ බොකුමුල්ල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව ටිපර් රථයකට වැලි පටවමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු ලොරි රථය සමග අත්අඩංගුවට ගෙන පන්නල පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 33 හා 43 වයස්වල පසුවන යෝගියාන හා නාලවලාන ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

**පන්නල** පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර.**

2024.02.17 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කහවත්ත පොලිස් වසමේ කලල්ඇල්ල හා යායින්න ප්‍රදේශ වලදී වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන කහවත්ත පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 42 හා 44 වයස්වල පසුවන කලල්ඇල්ල හා යායින්න ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.**

කහවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**